# වාණිජ ධාරා

**වාණිජ විෂයය ගුරු සිසු අත්වැල**
**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

**Business Studies**

**නිපුණතාව 1.0**
**ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.**

---

# ව්‍යාපාර පදනම හා ව්‍යාපාර පරිසරය

**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**


**සම්පත් දායකත්වය :** H.P.K.D. සඳමාලි
ර/මැදබැද්ද මහා විද්‍යාලය


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

**නිපුණතා මට්ටම** 1.1 : ව්‍යාපාර සංකල්පය විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**අපේක්ෂිත ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර සංකල්පය හඳුන්වයි.
- අවශ්‍යතා හා වුවමනා නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් නිදසුන් දක්වමින් සසඳයි.
- නිෂ්පාදිත යන්න හඳුන්වයි.
- මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගනුයේ නිෂ්පාදිතවලින් බව තහවුරු කරයි.
- භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් සසඳයි.
- අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමත් වෙළෙඳපොළත් අතර පවතින සම්බන්ධතාව පෙන්වා දෙයි.
- ව්‍යාපාරවල ගති ලක්ෂණ නිදසුන් සහිත ව විස්තර කරයි.
- ව්‍යාපාර කටයුතු යන්න පැහැදිලි කරයි.
- දෙන ලද ව්‍යාපාරයක ව්‍යාපාර කටයුතු ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර අරමුණු පැහැදිලි කරයි.
- ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාරවල දායකත්වය අගයයි.



# ව්‍යාපාර පදනම හා ව්‍යාපාර පරිසරය

# Foundation of Business and Business Enviroment

ව්‍යාපාර යනු

ලාභ ලැබීමේ අරමුණ ඇතිව හෝ නැතිව පවත්වාගෙන යන මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිශ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු සාමාන්‍යයෙන් ව්‍යාපාර ලෙස අර්ථ ගැන්වේ.

ඒ අනුව ව්‍යාපාර යනු මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා ඇති ඕනෑම ආර්ථික කටයුත්තකි.

## අවශ්‍යතා හා වුවමනා (Needs & Wants)

මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු කායික හා මානසික තත්ව අවශ්‍යතා ලෙස හැඳින්වේ.

උදා :- ආහාර, ඇඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍ය ආදිය

මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර වුවමනා ලෙස හැඳින්වේ.

උදා :- බත්, පාන්, ඔරලෝසුවක්, පරිගණකයක් ආදිය ලෙස තවදුරටත් පහත වගුවෙන් පැහැදිලි කල හැක.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| 1. ආහාර | 1. බත්, පාන්, ඉඳිආප්ප, තේ, පළතුරු, |
| 2. ඇඳුම් | 2. සාරි, ගවුම්, කලිසම්, සරම |
| 3. නිවාස | 3. තට්ටු නිවාස, යුගල නිවාස, නේවාසිකාගාර |
| 4. අධ්‍යාපනය | 4. පාසල, පිරිවෙන, විශ්ව විද්‍යාලය |
| 5. සෞඛ්‍ය | 5. රජයේ රෝහල්, පෞද්ගලික රෝහල් |
| 6. සන්නිවේදනය | 6. දුරකථන, ෆැක්ස්, විද්‍යුත් තැපෑල |
| 7. ආරක්ෂාව | 7. පොලීසිය, හමුදාව, රක්ෂණය |
| 8 විනෝදය | 8. සංගීතය, චිත්‍රපටි |

අවශ්‍යතා හා වුවමනා වල වෙනස්කම් පහත පරිදි දැක්විය හැකිය.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| • සීමිත වේ<br>• සෑම පුදගලයාටම පොදුය.<br>• ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය වේ.<br>• ව්‍යිපාරිකයින්ට නිර්මාණය කළ නොහැක.<br>• සමාජ බලවේග මඟින් වෙනස් කල නොහැක.<br>• ප්‍රාථමිකයි. | • අසීමිත වේ.<br>• පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්ය.<br>• අත්‍යාවශ්‍ය නොවේ.<br>• ව්‍යාපාර මඟින් නිර්මාණය කරයි.<br>• සමාජ බලවේග මඟින් වෙනස් කල හැකිය.<br>• ද්විතීකයි. |

## නිශ්පාදිතය Product

පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වෙළඳපොලට ඉදිරිපත් කරන ඕනෑම දෙයක් නිශ්පාදිතයක් වේ.

මෙය ප්‍රධාන වශයෙන් භාණ්ඩ හා සේවා ලෙෂ වර්ග කල හැකිය. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩ | සේවා |
|---|---|
| 1. භෞතික පැවැත්මක් ඇත. (ස්පර්ශ කල හැකියි.<br>2. ගබඩා කළ හැකිය.<br>3. සමජාතීය වන පරිදි නිශ්පාදනය කළ හැකිය.<br>4. සපයන්නාගෙන් වෙන් කළ හැකිය. | 1. භෞතික පැවැත්මක් නොමැත. (ස්පර්ශ කල නොහැකිය)<br>2. ගබඩා කළ නොහැකිය.<br>3. සපයන්නා අනූව වෙනස් වේ.<br>4. සපයන්නාගෙව් වෙන් කළ නොහැකිය. |

භාවිතය අනුවද භාණ්ඩ හා සේවා වර්ග කළ හැකිය. එය පහත සටහන මඟින් ඉදිරිපත් කළ හැකිය.

- නිශ්පාදිත
  - භාණ්ඩ
    - පැවැත්ම අනුව
      - කල්පවතින භාණ්ඩ
      - කල් නොපවතින භාණ්ඩ
    - භාවිතය අනුව
      - කාර්මික භාණ්ඩ
        - ප්‍රාග්ධන අයිතම
        - ද්‍රව්‍ය හා කොටස්
        - සැබයුම් හා ව්‍යාපාර සේවා
      - පාරිභෝගික භාණ්ඩ
        - පහසු භාණ්ඩ
        - සාප්පු භාණ්ඩ
        - විශේෂිත භාණ්ඩ
        - නොසෙවූ භාණ්ඩ
  - සේවා
    - වයාපාර සහය සේවා
    - සෘජු සේවා

## පාරිභෝගික භාණ්ඩ - Consumer Goods

මහජනයා සිය පරිභෝජනය සඳහා යොදා ගන්නා භාණ්ඩ වේ. කිසියම් අවස්ථාවකදී පාරිභෝගික භාණ්ඩ භාවිතයෙන් කෙළවර වේ. විනාශ වේ. නැවතත් අලුත් භාණ්ඩයක් එක් කළ යුතුය.

## පහසු භාණ්ඩ - Convenience Goods

පාරිභෝගිකයන් නිරන්තරයෙන් මිලට ගන්නා භාණ්ඩ පහසු භාණ්ඩ වේ.

ඒවායෙහි ලක්ෂණ ලෙස,

- මිලට ගැනීමේදී වැඩි වෙහෙසක් හෝ කාලයක් කැප නොකෙරේ.
- බොහෝවිට නිශ්චිත සන්නමක් සහිත භාණ්ඩ වේ.
  උදා:- පාන්, කිරි, ආහාර, සබන්, දන්තාලේප යනාදිය
- සාමාන්‍යයෙන් මිල පහළ මට්ටමක පවතී.
- සිල්ලර වෙළඳසැල් වලින් පහසුවෙන් මිලට ගත හැකිය.

## සාප්පු භාණ්ඩ - Shopping Goods

සමාන භාණ්ඩවල මිල, ගුණය, යෝග්‍යතාවය වැනි ලක්ෂණ සසඳා බලා මිලට ගනු ලබන භාණ්ඩ වේ.

මෙහිදී ගෙවන මිලට උපරිම තෘප්තියක් ගෙන දෙන භාණ්ඩ මිලට ගැනීමට අපේක්ෂා කරන අතර

- සන්නම
- ගුණය
- මිල
- පහසුව
- පෙනුම
- මෝස්තරය
- වගකීම යනාදී ගුණාංග සැලකිල්ලට ගනිමින් සාප්පු කිහිපයක සැරිසරා සමාන භාණ්ඩ සැසඳීමෙන් අනතුරුව මිලට ගනී.

## විශේෂිත භාණ්ඩ - Specialty Goods

මිලදී ගැනීමට විශේෂිත ආයාසයක් ගන්නා භාණ්ඩ වේ. සාමාන්‍යයෙන් මේවායේ මිල ඉතා ඉහළය.

උදා:- ස්වර්ණාභරණ, මෝටර් රථ, පරිගණක

## නොසෙවූ භාණ්ඩ - Unsought Goods

වෙළඳපොලෙහි විකිණීම සඳහා තිබුනත් පාරිභෝගිකයා ඒ බව නොදන්නා භාණ්ඩ වේ.

උදා:- අලුතින් හඳුන්වාදෙන රක්ෂණ ඔප්පු වර්ග, අලුතින් ප්‍රකාශයට පත්වන පොත් වර්ග

ඒවායේ ලක්ෂණ,

- ඒවා නොසෙවූ භාණ්ඩ ලෙෂ පවතිනුයේ හඳුන්වාදුන් මුල් අවධියේ පමණක් වීම.
- අධික ප්‍රවර්ධනයකින් පසු යම් කාලයකදී ඒවා සාප්පු හෝ පහසු භාණ්ඩ ඉවට පත් වීම.
- අඩු පිරිවැටුපක් තිබීම.
- මිල තරමක් ඉහළ යාම.
- විශාල ලෙස ප්‍රවර්ධනය කළ යුතු වේ.

## කාර්මික භාණ්ඩ - Indñtrial Goods

වෙනත් භාණ්ඩ නිපදවීමට යොදා ගන්නා භාණ්ඩ වේ.

උදා:- මොටර් රථ නිපදවන ආයතනයක් ටයර්, බැටරි මිලට ගැනීම.

ද්‍රව්‍ය සහ කොටස් (Material & Parts) උදා:-යකඩ, වානේ

ප්‍රාග්ධන අයිතමයන් (Capital Items)

සැපයුම් සහ ව්‍යාපාර සේවා (supplies & Business Services)

උදා:- විදුලිය, ගෑස්, ජලය, නඩත්තුව

## වෙළඳපොල - Market

ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගැසෙන හෝ සම්බන්ධ වන ඕනෑම තත්වයක් වෙළඳපොල ලෙෂ හැඳින්වේ.

මිනිස් අවශ්‍යතා හි වුවමනා ඉටු කර ගැනීමට වෙළඳපොල තුලින් භාණ්ඩ හා සේවා සපයා ගනී

## ව්‍යාපාර ගති ලක්ෂණ - Characteristics of Business

01. විකුණුම් හෝ හුවමාරුවීම් සිදු වීම.

සෑම ව්‍යාපාරයක්ම භාණ්ඩ හා සේවා මුදල්මය අගයක් මත විකිණීම හෝ හුවමාරු කිරීම සිදු කෙරේ. භාණ්ඩ හා සේවා මිලක් මත මිලදී ගැනීම හා විකිණීම ව්‍යාපාරවල අත්‍යවශ්‍ය සාධකයකි.

02. භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු වීම.

සෑම ව්‍යාපාරයක්ම, අන් අයට විකිණීම සඳහා භාණ්ඩ හා සේවා නිශ්පාදනය කිරීම සහ/හෝ මිලදී ගැනීම සිදු කරයි. ඒවා පාරිභෝගික භාණ්ඩ හො කාර්මික භාණ්ඩ විය හැකිය.

03. ගනුදෙනු අඛණ්ඩව සිදු වීම.

අඛණ්ඩ පදනමක් මත දිගින් දිගටම භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු කරයි නම් එය ව්‍යාපාරයක් ලෙස හඳුන්වයි.

04. ලාභයෙන් / ප්‍රතිලාභයෙන් අභිප්‍රේරණය වීම.

ව්‍යාපාරයක මූලික අරමුණ මුදල් සැපයීම හා ධනය අත්පත් කර ගැනීමයි. ඒ අනුව රුපියල් ශතවලින් ලබන ලාභය, ව්‍යාපාරික සම්බන්ධතා ගොඩනගා ගැනීම, ව්‍යාපාරික අවස්ථා උදා කර ගැනීම, සමාජ ප්‍රතිලාභ අත්කර දීම යනාදිය අන්තර්ගත වේ. ව්‍යාපාර ක්ෂේත්‍රයේ ලාභ අරමුණු කර නොගත් ඉහත ප්‍රතිලාභ අරමුණු කරගත් ඒවාද වේ.

එබැවින් ව්‍යාපාරයක වර්ධනය සහ ප්‍රසාරණය සඳහා ලාභය අත්‍යවශයම වේ.

05. අවදානමක් තිබීම.

ලාභ ලැබීමට ඇති අවිනිශ්චිතතාව හා අලාභ ස්දු වීමට ඇති හැකියාව නිසා ව්‍යාපාරවලට ප්‍රායෝගිකව පාලනය කළ නොහැකි නිසා අවදානම ඇති වේ.

- ❖ පාරිභෝගික රුචිය මොස්තර සහ ඉල්ලුම වෙනස්වීම නිසා
- ❖ යන්ත්‍ර උපකරණ හා නිශ්පාදන තාක්ෂණය වෙනස් වීම නිසා
- ❖ වෙළඳපොල තරඟකාරිත්වය ඉහළ යාම නිසා
- ❖ අමුද්‍රව්‍ය හිඟය෴ විදුලිය බිඳවැටීම හා ඉන්ධන හිඟය ඇතිවීම නිසා
- ❖ ක්‍රමිකයන්ගේ ගැටලු, වැඩ වර්ජන ආදිය නිසා
- ❖ ගිනිගැනිලි, සොර ෂතුරු උපද්‍රව, අනතුරු ආදී විපත් නිසා
- ❖ ව්‍යාපාරයේ සම්පත් භාවිතය පිළිබඳ වැරදි කළමනාකරණ තීරණ නිසා

06. වුවමනා නිර්මාණය කිරීම.

විනිස් වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිපදවීම ව්‍යාපාර විසින් සිදු කරයි. එය සිදුකරන ආකාර කිහිපයකි.

- ❖ අමුද්‍රව්‍ය නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම මඟින්
- ❖ යම් භාණ්ඩයක් බහුල ස්ථානයක සිට එම භාණ්ඩය සඳහා විශාල ඉල්ලුමක් පවතින වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කිරීම මඟින්
- ❖ යම් භාණ්ඩයක් හිඟ කාලවලදී ලබාදීම සඳහා ගබඩා කිරීම මඟින්

ආදී ලෙස භාණ්ඩ නිශ්පාදනය හා සේවා සැපයීම තුලින් මිනිස් වුවමනා නිර්මාණය කරයි.

07. ආර්ථික කටයුත්තක් වීම.

හිඟ සම්පත් භාවිතයෙන් භාණ්ඩ හා සේවා නිශ්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ කටයුතුවල නිරත වීම හේතුවෙන් ව්‍යාපාර අත්‍යවශ්‍යයෙන්ම ආර්ථික කටයුත්තක් වේ. එය මුදල් සැපයීමේ පරමාර්ථයෙන් සිදු වන්නකි.

ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු 2 කි.

1. මිනිස් අවශ්‍යතා හි වුවමනා සපුරාලීම.
2. සම්පත් වලට අගය එකතු කිරීම.

හාණ්ඩයක් හෝ සේවාවක් නිශ්පාදයේදී යොදා ගන්නා සම්පත්වල ස්වරූපය වෙනස් කිරීම මඟින් ඇති වන අගය වැඩි වීම එකතු කළ අගය ලෙස හැඳින්වේ.

මෙලෙස සම්පත් වලට අගය එකතු කිරීම ව්‍යාපාරයක සිදු වන ප්‍රධාන කටයුත්තකි.

## ව්‍යාපාරවල අරමුණු

1. වෙළඳපොලේ රැඳී සිටීම.
2. ලාභ උපරිම කිරීම.
3. විකුණුම් උපරිම කිරීම.
4. වෙළඳපොල කොටස වැඩි කර ගැනීම.
5. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම.
6. කොටස්වල වෙළඳපොල අගය උපරිම කිරීම.
7. ව්‍යාපාරිකයින්ගේ පුද්ගලික තෘපිත්ය
8. සමාජ හා ප්‍රජාවගේ සුභසාධනය
9. සේවක සුභ සාධනය

ආර්ථිකය පැවැත්මට ද ව්‍යාපාර දායක වේ.

උදාඃ- වෙනස්වන සංකීර්ණ වුවමනා සපුරාලීම.

නවෝත්පාදනය

රැකියා උත්පාදනය

ජාතික ආර්ථික සංවර්ධනය

පැවරුම 01

"ආසිරි බේකර්ස්" ඔබ ප්‍රදේශයේ ප්‍රසිද්ධ බේකරි න්ශ්පාදන ව්‍යාපාරයකි. එහි කටයුතු හොඳින් අධ්‍යනය කර පහත සඳහන් ගැටලු සඳහා පිළිතුරු සපයන්න.

1. එම ව්‍යාපාරය මඟින් මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරනු ලබන ආකාරය පැහැදිලි කරන්න.
2. ඒ හරහා සම්පත් වලට අගය එකතු කිරීම කරන ආකාරය පැහැදිලි කරන්න.
3. එම ව්‍යාපාරයේ අරමුණු දක්වන්න.
4. ඒ හරහා ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ ලැයිස්තු ගත කරන්න.

**නිපුණතා මට්ටම 1.2** : ව්‍යාපාර විකාශනය හා ප්‍රවණතා අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය පැහැදිලි කරයි.
- ව්‍යාපාර විකාශනයේ අවස්ථා දක්වයි.
- ඍජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය අතර වෙනස පැහැදිලි කරයි.
- මුදලේ විකාශනය විස්තර කරයි.
- වෙළෙඳාමේ අතීත ස්වරූපය හා වර්තමාන ස්වරූපය සසඳයි.
- වාණිජ්‍යය හා වෙළෙඳාම අතර වෙනස පැහැදිලි කරයි.
- ව්‍යාපාර සඳහා පවතින උපකාරක සේවා හඳුන්වා දෙයි.
- විද්‍යුත් වාණිජ්‍යය පැහැදිලි කරයි.
- විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ ප්‍රචලිත වීමට හේතු අනාවරණය කරයි.
- ව්‍යාපාර ලෝකයේ වර්තමානප්‍රවණතා සහ එමගින් ව්‍යාපාරවල සිදු වී ඇති වෙනස්කම් පැහැදිලි කරයි.

## ව්‍යාපාර විකාශනය හා ප්‍රවණතා

# Development of Business & New Trends

- ⇨ මිනිසාගේ අවශ්‍යතා ඔහු විසින්ම නිශ්පාදනය කර ගත් ඇත අතීතයේ පැවතියේ ස්වයංපෝෂිත අර්ථික ක්‍රමයකි.
- ⇨ එය ඍජු නිශ්පාදනය (Direct Production) ලෙස හැඳින්වේ.
- ⇨ ඒ තුලින් විශේෂීකරණය ඇති විය.
- ⇨ එහි ප්‍රතිඵලයක් ලෙස අතිරික්ත නිශ්පාදනය ඇති විය.
- ⇨ අත්රික්ත නිශ්පාදනය ඔවුනොවුන් අතර හුවමාරු කර ගැනීම නිසා භාණ්ඩ හුවමාරුව සිදු විය. (Barter System) ව්‍යාපාර විකාශනයේ මුල්ම අවස්ථාව භාණ්ඩ හුවමාරු ක්‍රමය වේ.
- ⇨ භාණ්ඩ හුවමාරුව නිසා භාණ්ඩවල අයිතිය වෙනස් විය. මෙම වෙනස වෙළඳාම ( Trade) ලෙස හඳුන්වන ලදී.
- ⇨ වෙළඳපොල සඳහා නිශ්පාදනය කිරීම වක්‍ර නිශ්පාදනය වේ.

භාණ්ඩ හුවමාරුවේ දුර්වලතා මග හරවා ගැනීමට හුවමාරු මාධ්‍ය ලෙස විවධ ද්‍රව්‍ය භාවිතා කරන ලදී.

## භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට අද දක්වා මුදල් භාවිතයේ ඇති වූ ක්‍රමික විකාශය

1. ද්‍රව්‍ය භාවිතය
   උදා:- සිප්පිකටු, දුම්කොළ
2. ලෝහ වර්ග භාවිතය
   උදා:- රන්, රිදී වැන දෑ
3. ලෝහ කාසි මුදල් භාවිතය

විවිධ ප්‍රමාණවලින් යුත් ලෝහ කැබලිවල මුහුණත බර, පිරිසිදු බව සහ අගයත් සදහන් කරන ලදී. පසු කාලීනව ඇති වූ අච්චු කාසි වලට පදනම මෙයයි.

4. කාසි හා නෝට්ටු භාවිතය

වටිනා ලෝහ මුදල් ලෙස භාවිතයට ගැනීමේ අපහසුතාවට පිළියමක් ලෙස නෛසර්ගික වටිනාකමක් නොමැති කාසි භාවිතයට ගත් අතර, පසු කාලීනව නෝට්ටු මුදල් භාවිතයට ගන්නා ලදී. රජයේ බලයලත් අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු මෙයට අයත්ය.

උදා:- ශ්‍රී ලංකාව - රුපියල්

ඇමරිකාව - ඩොලර්

බ්‍රිතාන්‍ය - පවුම්

5. බැංකු මුදල් භාවිතය
   බැංකු ජංගම ගිණුම් ආශ්‍රිත චෙක්පත් භාවිතය
6. විද්‍යුත් මුදල් භාවිතය

තොරතුරු තාක්ෂණයේ හා ඩිජිටල් තාක්ෂණයේ දියුණුව සමග හදුන්වා දුන් පරිගණක ජාලයක් මගින් ගනුදෙනු සිදුවන ක්‍රමයකි.

උදා:- ණයපත්

හරපත්


පෙර ගෙවුම් කාඩ්පත්

යුරෝපීය රටවල ඇති වූ කාර්මික ප්‍රබෝධය සමග මෙතෙක් පැවත් ගෘහ කර්මාන්ත මහා පරිමාණ කර්මාන්ත බවට පත් වූ අතර ඒ සමඟ වෙළඳාමේ ප්‍රසාරණයක් සිදු විය.

කාර්මික විප්ලවයත් සමඟ බැංකු, ප්‍රවාහනය, රක්ෂණය, සන්නිවේදනය, ගබඩාකරණය වැනි උපකාරක සේවා වලද වර්ධනයක් සිදු විය.

කාර්මික විප්ලවය ව්‍යාපාර විකාශනයේ තුන්වන අදියර වේ.

වාණිජමය යනු වෙළඳාම හා උපකාරක සේවාවල එකතුව වේ.




| | |
|---|---|
| විද්‍යුත් වාණිජ්‍ය යනු | අන්තර්ජාලය හරහා මිල දී ගැනීමේ හා විකිණීමේ කටයුතු කිරීමයි. |
| විද්‍යුත් ව්‍යාපාර යනු | ව්‍යාපාරවලට අදාල සියලුම කාර්යයන් අන්තර්ජාලය හරහා සිදු කිරීම වේ. |

තොරතුරු යුගය ව්‍යාපාර විකාශනයේ හතරවන අදියර වේ.

## <u>විද්‍යුත් වාණිජ්‍ය ප්‍රචලිත වීමට බලපෑ හේතු</u>

- ලියකියවිලි වලින් තොරව ව්‍යාපාර තොරතුරු හුවමාරු කිරීමට හැකිවීම.
- ව්‍යාපාර කටයුතු වේගවත් වීම.
- මෙහෙයුම් පිරිවැය, තොග පිරිවැය අඩු වීම.
- ගෝලීය වූ වෙළඳපොල අවකාශයක් බිහි වීම.
- භාණ්ඩ හා සේවා වල ගුණාත්වය ඉහළ යාම.
- ගනුදෙණුකරුවන්ගේ කාලය හා ශ්‍රමය ඉතුරු වීම.
- ඵරිගණක සාක්ෂරතාව වැඩි වීම.
- යටිතල පහසුකම් වල වර්ධනය.

## <u>ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා හතර</u>

1. භාණ්ඩ හුවමාරුව
2. මුදල් භාවිතය
3. කාර්මික විප්ලවය
4. තොරතුරු ආර්ථිකය

## ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා

1. ගෝලීයකරණය ව්‍යාප්ත වීම.
2. විද්‍යුත් ව්‍යාපාර බිහි වීම.
3. විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම.
4. පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම.
5. ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත් වීම.

**නිපුණතා මට්ටම** 1.3 : විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර වර්ග කළ හැකි විවිධ නිර්ණායක ලැයිස්තුගත කරයි.
- පාසල පිහිටි ප්‍රදේශයේ ඇති ව්‍යාපාර විවිධ නිර්ණායක මත වර්ග කරයි.
- එක ම ව්‍යාපාරය විවිධ නිර්ණායක මත වර්ග කිහිපයකට අයත් වන බව පැහැදිලි කරයි
- දෙන ලද ව්‍යාපාරයක් එක් එක් නිර්ණායකය මත කුමන වර්ගයකට අයත් වන්නේ දැයි දක්වයි.
- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය වර්ග කරන ආකාරය දක්වයි.
- දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් නිෂ්පාදන අංශයේ දායකත්වය ඉදිරිපත් කරයි.

## ව්‍යාපාර වර්ගීකරණය

# Classification of Business

පහත දැක්වෙන නිර්ණායක යටතේ ව්‍යාපාර වර්ග කළ හැකිය.

1. නිශ්පාදනයේ ස්වභාවය අනුව

   I. ප්‍රාථමික අංශය ( Primary)

ස්වභාව ධර්මයෙන් ලැබී ඇති දේ ඒ ආකාරයෙන්ම ප්‍රයෝජනයට ගන්නා නිශ්පාදන ව්‍යාපාරයකි.

උදා:- කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය, පතල් හා කැනීම් කර්මාන්තය

II. ද්විතික අංශය (Secondary)

ප්‍රාථමික නිශ්පාදන නැවත වෙනස් කිරීමට භාජනය කිරීමේ ව්‍යාපාරයයි.

උදා:- නිශ්පාදන කර්මාන්ත, ඉදිකිරීම් කර්මාන්තය

III. තෘතීයික අංශය (Tertiary)

සියලුම සේවා සැපයීමේ ව්‍යාපාරයයි.

උදා:- විදුලිය, ගෑස්, විෂ්ප හා වායු සමීකරණ සැපයීම.

ජලය පිරිසිදු කිරීම හා බෙදා හැරීම.

මලාප්‍රවාහන කටයුතු, කසල කළමණාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය.

තොළඳාම, ප්‍රවාහනය, නවාතැන් සැපයීම හා ආහාර පාන සැපයීම.

තොරතුරු හා සන්නිවේදන කටයුතු

මූල්‍ය, රක්ෂණ හා නිවාස අයිතියහා දේපල වෙළඳාම්

වෘත්තීමය සේවා හා වෙනත් පෞද්ගලික සේවා

රාජ්‍ය පරිපාලන, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂාණ සේවා

2. හිමිකාරිත්වය අනූව/අයිතිය අනුව
   - I. පෞද්ගලික අංශයේ ව්‍යාපාර
     උදා:- කේවල ස්වාමී, හවුල්, සමාගම්, සමූපකාර
   - II. රාජ්‍ය අංශයේ හෙවත් පොදු අංශයේ ව්‍යාපාර
     උදා:- රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම්

3. අරමුණ අනුව
   - I. ලාභ අරමුණු කරගත් ව්‍යාපාර
     උදා:- තනි, හවුල්, සමාගම්
   - II. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර
     උදා:- සමාජ සේවය සඳහා වූ පුණ්‍ය ආයතන

4. පරිමාණය අනුව
   - I. සුලු හා මධ්‍ය පරිමාණ වයාපාර
   - II. මහා පරිමාණ ව්‍යාපාර

5. නිශ්පාදන අංශය අනූව/කර්මාන්ත මූල්‍ය අනූව
   - I. කෘෂිකාර්මික ව්‍යාපාර
   - II. කාර්මික ව්‍යාපාර
   - III. සේවා ව්‍යාපාර

### ව්‍යාපාර වර්ගීකරණ පදනම

- නිශ්පාදනයේ ස්වභාවය
  - ප්‍රාථමික
  - ද්විතික
  - තෘතීයික
- හිමිකාරිත්වය අනුව
  - පෞද්ගලික
  - පොදු
- අරමුණ අනුව
  - ලාභ අරුමුණු කරගත්
  - ලාභ අරමුණු කර නොගත්
- පරිමාණය අනුව
  - සුළු හා මධ්‍ය
  - පරිමාණ
  - මහා පරිමාණ
- නිශ්පාදන අංශය අනුව
  - කෘෂිකාර්මික
  - කාර්මික
  - සේවා

### කර්මාන්ත මූල්‍ය අනුව දළ දේශීය නිෂ්පාදිතය

| ආර්ථික කටයුතු ( 2010 ස්ථාවර මිල අනුව ) | ද.දේ.නි.ට දායකත්වය(%) 2018 |
|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධිවර කර්මාන්තය** | **7.0** |
| ධාන්‍ය වගාව ( වී හාර) | 0.1 |
| වී වගාව | 0.7 |
| එළවළු වගාව | 0.6 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහු වාර්ෂික නොවන බෝග | 0.0 |
| පළතුරු වගාව | 0.6 |
| තෙල් සහිත පලතුරු බෝග වගාව (පොල්,තැඹිලි,ඔයිල් පාම් වගාව | 0.6 |
| තේ වගාව | 0.7 |
| වෙනත් පානීය බෝග වගාවන් (කෝපි. කොකෝවා ආදී) | 0.0 |
| කුළුබඩු, සුවඳදෙන බෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 0.7 |
| රබර් වගාව | 0.2 |
| වෙනත් බහුවාර්ෂික බෝගවගාව | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් ෂත්ව නිශ්පාදනයන් | 0.6 |
| | 0.1 |

| | |
|---|---|
| පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | |
| වන වගාව, ගස් කැපීම, හා වනාන්තර ආශ්‍රිත නිශ්පාදන | 0.6 |
| ධීවර කර්මාන්තය | 1.2 |
| **කර්මාන්ත** | **26.1** |
| තෙල් හා කැනීම් කර්මාන්තය | 2.3 |
| නිශ්පාදන කර්මාන්ත | 15.5 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 1.0 |
| ජලය පිරිසිදු කිරීම හා බෙදා හැරීම | 0.1 |
| මලාප්‍රවාහන කටයුතු, කසල කළමණාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 0.3 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 6.8 |
| **සේවාවන්** | **57.7** |
| වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 23.3 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 0.7 |
| මූල්‍ය රක්ෂණය සහ නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 14.0 |
| වෘත්තීමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 11.6 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 8.1 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **90.8** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු සහනාධාර | 9.2 |
| වෙළඳපොල මිල අනුව දළ දේශීය නිශ්පාදිතය (ද.දේ.නි.) | 100.0 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව් වාර්ෂික වාර්තාව - 2018

**දළ දේශීය නිශ්පාදිතයේ ආංශික සංයුතිය**

නිශ්පාදනයේ ස්වභාවය අනුව වර්ග කිරීමේදී පතල් හා කැණීම් කර්මාන්තය ප්‍රාථමික අංශයට අයත් වන අතර කර්මාන්ත මූල්‍ය අනුව වර්ග කිරීමේදී පතල් හා කැනීම් කර්මාන්තය කාර්මික අංශයට අයත් වේ.

එසේම නිෂ්පාදනයේ ස්වභාවය අනුව විදුලිය, ගෑස්, වාෂ්ප, හා වායු සමීකරණ සැපයීම, ජලය පිරිසිදු කිරීම සහ බෙදා හැරීම, මලාපවහන කටයුතු, කසළ කළමණාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය තෘතීයික අංශයට අයත් වුවද කර්මාන්ත මූල්‍ය අනුව ඒවා කාර්මික අංශයට අයත් වේ.

## <u>ශ්‍රී ලංකා ආර්ථිකයේ සේවා අංශයේ වර්ධනයට බලපා ඇති හේතු</u>

1. පාරිභෝගිකයාගේ වියදම් කළ හැකි ආදායම වැඩි වීම.
2. ජීවන රටාව වෙනස් වීම.
3. සංකීර්ණ වූ භාණ්ඩ හා නව තාක්ෂණයට අදාල සේවා වල වැඩි වීම.
4. ව්‍යාපාර වැඩිපුර වෘත්තීය සේවා ඉල්ලුම් කිරීම.
5. විද්‍යුත් වාණිජ්‍යයේ ව්‍යාප්තිය
6. සේවා ව්‍යාපාරයට ඇතුල්වීමට ඇති බාධා අඩු කිරීම.

පැවරුම 02

ඔබ ප්‍රදේශයේ පවතින ව්‍යාපාර පිළිබඳ ඇගයීමක් සිදු කර පහත වගුව හැකිතාක් සම්පූර්ණ කරන්න.

| ව්‍යාපාරයේ නම | නිශ්පාදනයේ ස්වභාවය අනුව | | | හිමිකාරිත්වය අනුව | | අරමුණ අනුව | | පරිමාණය අනුව | | නිශ්පාදන අංශය අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාථමික | ද්විතීයික | තෘතීයික | පෞද්ගලික | පොදු | ලාභ අරමුණු කරගත් | ලාභ අරමුණු කර නොගත් | ක්ෂුද්‍ර හා මධ්‍ය පරිමාණ | මහා පරිමාණ | කෘෂිකාර්මික | කාර්මික | සේවා |
| | | | | | | | | | | | | |

**නිපුණතා මට්ටම 1.4** : ව්‍යාපාර, යෙදවුම්-නිමැවුම් ක්‍රියාවලියක් ලෙස විගහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාරවල යෙදවුම් පැහැදිලි කරයි.
- ව්‍යාපාර කාර්යයන් පැහැදිලි කරයි.
- ව්‍යාපාරවල නිමැවුම් ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර, යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස රූප සටහනකින් දක්වයි.
- කිසියම් නිමැවුමකට අදාළ යෙදවුම්, එක් එක් යෙදවුම් වර්ගය යටතේ වෙන් කරදක්වයි.
- ව්‍යාපාර කාර්යයන් ව්‍යාපාරවල ස්වභාවය අනුව වෙනස් වන බව නිදසුන් සහිතව පැහැදිලි කරයි.

# <u>ව්‍යාපාර යෙදවුම් නිමවුම් ක්‍රියාවලිය</u>


# <u>Business Input And Out Put Process</u>

ලාභ අරමුණු කරගත් හෝ නොගත් ඕනෑම ව්‍යාපාරයක් භාණ්ඩ හා සේවා නිපදවීමට යොදා ගනු ලබන සම්පත් නිෂ්පාදන සාධක (සම්පත්) ලෙෂ හඳුන්වයි.

1. භූමිය / ස්වභාවික සම්පත් - Natural Resourcs
2. ශ්‍රමය / මානව සම්පත් - Human Resourcs
3. ප්‍රාග්ධනය - Capital
4. ව්‍යවසායකත්වය - Entrepreneurship
5. දැනුම - Knowledge
6. තොරතුරු - Information
7. කාලය - Time

ඉහත දැක් වූ නිශ්පාදන සාධක හෙවත් සම්පත් යෙදවුම් (Input) ලෙස ද හැදින්වේ. මෙහෙයුම් ක්‍රියාවලිය තුලින් යෙදවුම්, නිමවුම් හෙවත් භාණ්ඩ හා සේවා බවට පරිවර්තනය කෙරේ.

මෙම යෙදවුම් සහ නිමවුම් ක්‍රියාවලිය පහත සටහන මඟින් සරලම දැක්විය හැකිය.




ව්‍යාපාර විවිධ කාර්යයන් ඉටු කරයි. ඒවා පහත දැක්වෙන ලෙස වර්ග කළ හැකිය.

1. පරිපාලන කටයුතු ( Administration )

ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ වූ ලියකියවිලි පවත්වා ගෙන යාම, සන්නිවේදන කටයුතු පවත්වා ගෙන යාම යනාදිය ඇතුලත් වේ.

2. මෙහෙයුම් (නිශ්පාදන) ( Production )

සම්පත්, භාණ්ඩ හෝ සේවා බවට පත් කිරීමේ ක්‍රියාවලිය වේ.

3. අලෙවිකරණය ( Marketing )

ගනුදෙනු කරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම වේ.

4. මූල්‍ය කටයුතු ( Finance )

අරමුදල් සම්පාදනය හා යෙදවීම හා ඊට අදාල කටයුතු වේ.

5. මානව සම්පත් කටයුතු ( Human Resource )

ආකර්ෂණය, තෝරා ගැනීම, බඳවා ගැනීම, පුහුණු කිරීම, සුබසාධනය යනාදිය සම්බන්ධයෙන් වූ කටයුතු වේ.

6. පර්යේෂණ හා සංවර්ධනය ( Research & Development )

නිමවුමේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම හා නව නිපයුම් සොයා ගැනීම ඇතුලත් වේ.

7. තොරතුරු කළමණාකරණය (Information Management)

තොරතුරු සම්පාදනය, තොරතුරු යාවත් කාලීන කිරීම, තොරතුරු පද්ධති කළමණාකරණය යනාදිය වේ.

ඒ අනුව ව්‍යාපාර යෙදවුම් නිමවුම් ක්‍රියාවලිය පහත පරිදි නැවත ඉදිරිපත් කළ හැකිය.

| යෙදවුම්/සම්පත් | | ව්‍යාපාර කාර්යයන් | | නිමවුම |
|---|---|---|---|---|
| භූමිය<br>ශ්‍රමය<br>ප්‍රාග්ධනය<br>ව්‍යවසායකත්වය<br>තොරතුරු<br>කාලය<br>දැනුම | → | පරිපාලනය<br>මෙහෙයුම් (නිශ්පාදන)<br>අලෙවිකරණය<br>මූල්‍ය කටයුතු<br>මානව සම්පත් කටයුතු<br>පර්යේෂණ හා සංවර්ධනය<br>තොරතුරු කළමණාකරණය | → | භාණ්ඩ හෝ සේවා |

පැවරුම 01

බේකරියක ව්‍යාපාර ක්‍රියාවලිය, යෙදවුම්, නිමවුම් ක්‍රියාවලියක් ලෙස රූප සටහනකින් දක්වන්න.

**නිපුණතා මට්ටම 1.5 :** ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 06**

**ඉගෙනුම් ඵල :**

- තෝරාගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ලැයිස්තුගත කරයි.
- එක් එක් පාර්ශ්වය ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු පැහැදිලි කරයි.
- එක් එක් පාර්ශ්වය, ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු විවිධ වන බව අනාවරණය කරයි.
- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.
- ව්‍යාපාරයක සාර්ථක පැවැත්ම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්ව යන්ගේ අපේක්ෂා පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව පෙන්වා දෙයි.
- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව, ව්‍යාපාර කෙරෙහි දක්වන ඇල්ම සහ ඔවුන් ව්‍යාපාරය කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව මත එම පාර්ශ්වයන්ගේ ප්‍රමුඛතාව තීරණය කරයි.

## ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව - Stakeholders

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව නැතහොත් ඇල්මැති පාර්ශව කිහිපයක් පහත දැක්වේ.

අයිතිකරුවෝ / කොටස් හිමියෝ

කළමණාකරුවෝ

සේවකයෝ

ණයහිමියෝ

පාරිභෝගිකයෝ

සැපයුම්කරුවෝ

විභව ආයෝජකයෝ

රජය

ප්‍රජාව

වෙනත් පාර්ශව

ඒ එක් එක් පාර්ශවය ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු පහත දැක්වේ.

| | |
|---|---|
| අයිතිකරුවෝ - | තමන් ආයෝජනය කළ මුදලට ප්‍රමාණවත් ලාභයක් ලැබේදැයි දැන ගැනීමට |
| | ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ දැන ගැනීමට |
| | වෙළඳපොල කොටස දැන ගැනීමට |
| කළමණාකරුවෝ- | ව්‍යාපාර ලාභය උපරිම කිරීමට |
| | ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ දැන ගැනීමට |
| | කළමණාකරණ තීරණවල සාර්ථක අසාර්ථක බව දැනගැනීමට |
| සේවකයෝ- | ඉහළ වැටුපක් ලබා ගැනීමට |
| | ප්‍රසාද දීමනා ලැබේදැයි දැන ගැනීමට |
| | රැකියාවේ උසස්වීම් ලබා ගැනීමට |
| ණයහිමියෝ- | සපයන ලද ණය මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාව දැන ගැනීමට |
| | ණය මුදලේ සුරක්ෂිත බව දැන ගැනීමට |
| | ඇප සුරැකුම්වල සුරක්ෂිත බව තහවුරු කර ගැනීමට |
| පාරිභෝගිකයෝ- | ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීමට |
| | වගකීම් නිසි පරිදි ඉටු කරන්නේදැයි බැලීමට |
| | ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට |
| සැපයුම්කරුවෝ- | අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමට |
| | සපයන ලද භාණ්ඩ සඳහා මුදල් ආපසු අයකර ගැනීමට |

විහව ආයෝජකයෝ- තමන් සතු සම්පත් අනාගතයේදී එම ව්‍යාපාරයේ ආයෝජනය කරයි.

රජය - බදු අයකර ගැනීමට/බදු සහන ලබා දීමට

සේවා නියුක්තිය වර්ධනය කිරීමට

ආර්ථික සංවර්ධනය පිළිබඳ මැන බැලීමට

ප්‍රජාව - පරිසරය සුරැකීම පිළිබඳ සොයා බැලීමට

රැකියා අවස්ථා ලබා ගැනීමට

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව, වයාපාරයකට වැදගත් වීමට හේතු කිහිපයක් පහත සඳහන් වේ.

| පාර්ශවය | ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු |
|---|---|
| අයිතිකරුවෝ - | ආයෝජන වැඩි කර ගැනීමට |
| | ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට |
| සේවකයෝ - | සේවක කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට |
| | සේවකයන් රඳවා ගැනීමට |
| | සේවක ආකර්ෂණය ලබා ගැනීමට |
| ණයහිමියෝ- | අඛණ්ඩ අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගැනීමට |
| | අඩු පිරිවැයකින් අරමුදල් සම්පාදනය කරගැනීමට |
| රජය- | බදු සහන ලබා ගැනීමට |
| | යටිතල පහසුකම් ලබා ගැනීමට |
| | තාක්ෂණික දැනුම ලබා ගැනීමට |
| ගනුදෙනුකරුවෝ- | අදාල භාණ්ඩ හෝ සේවා සඳහා වෙළඳපොල සුරක්ෂිත කර ගැනීමට |
| | පාරිභෝගික විශ්වාසය ගොඩනගා ගැනීමට |
| | ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතීත්වය ඇති කර ගැනීමට |

**නිපුණතා මට්ටම 1.6 :** ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ව්‍යාපාර පරිසරය වර්ග

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර පරිසරය හඳුන්වයි.
- ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාරිකයෙකුට ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර පරිසරය වර්ග කරයි.
- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන විවිධ පරිසර බලවේග ලැයිස්තුගත කරයි.
- දෙන ලද ව්‍යාපාරයක අභ්‍යන්තර හා බාහිර පරිසර බලවේග සඳහා නිදසුන් දක්වයි.

## ව්‍යාපාර පරිසරය – Business Environment

ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරන සාධක ක්‍රියාත්මක වන පරිසරය ව්‍යාපාර පරිසරය වේ. එය කොටස් 2 කට වර්ග කළ හැකිය.

1. අභ්‍යන්තර පරිසරය ( Internal Environment )

සංවිධානය තුළ සිටින එයට බලපෑම් කරන කණ්ඩායම් (Forces) හා තත්ව ( Condition ) වේ,

2. බාහිර පරිසරය ( External Environment )

ව්‍යාපාර පරිසරයට බලපෑම් කරන ව්‍යාපාර ආයතනයට පිටතින් ඇති සියලුම දේ වේ.

ව්‍යාපාර බාහිර පරිසරයට අයත් ව්‍යාපාරයට බලපෑම් ඇති කරන සුවිශේෂී සංවිධාන හෝ කණ්ඩායම් ආසන්න පරිසරය ලෙස හැඳින්වේ.

ව්‍යාපාරයක පුළුල් වටපිටාව සහ ඒ හා බැඳුණු බලපෑම් කරන කණ්ඩායම් සාර්ව හෙවත් පොදු පරිසරය වේ.

ව්‍යාපාර පරිසර සාධක ගැලීම් සටහනකින් දැක්විය හැකිය.


ව්‍යාපාර පරිසරය

| අභ්‍යන්තර පරිසරය | බාහිර පරිසරය | |
|---|---|---|
| | ආසන්න පරිසරය | බාහිර පරිසරය |
| අයිතිකරුවෝ | පාරිභෝගිකයෝ | ආර්ථික පරිසරය |
| කළමණාකරුවෝ | සැපයුම්කරුවෝ | දේශපාලන පරිසරය |
| සේවකයෝ | තරගකරුවෝ | නෛනතික පරිසරය |
| සංවිධාන ව්‍යුහය | ආදේශන භාණ්ඩ | ප්‍රජා පරිසරය |
| සංවිධානමය සංස්කෘතිය | නිශ්පාදකයෝ | තාක්ෂණික පරිසරය |
| | වෙළඳපොලට පිවිසීමට අපේක්ෂා කරන නව ව්‍යාපාරිකයෝ | ස්වභාවික පරිසරය |
| | | සමාජ හා සංස්කෘතික පරිසරය |
| | | ගෝලීය පරිසරය |

## ව්‍යාපාර පරිසරය අධ්‍යනයෙන් අත් වන ප්‍රයෝජන

1. ශක්තීන් හඳුනා ගැනීම
2. දුර්වලතා හඳුනා ගැනීම
3. ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම
4. තර්ජන හඳුනා ගැනීම

ව්‍යාපාර පරිසරය වර්ග කිරීම පහත රූප සටහනින්ද පෙන්විය හැක.


සාර්ව පරිසරය
ආර්ථික
ගනුදෙනුකරුවෝ
බාහිර පරිසරය
ගනුදෙනුකරුවෝ
(පාරිභෝගිකයෝ)
ගෝලීය
නෛතික
ආසන්න පරිසරය
අයිතිකරුවෝ
කළමණාකරුවෝ
තරගකරුවෝ
සැපයුම්කරුවෝ
සේවකයෝ
අභ්‍යන්තර
පරිසරය
සංවිධාන
ව්‍යුහය
සමාජ හා
සංස්කෘතික
තාක්ෂණික
සංවිධානමය
සංස්කෘතිය
සම්පත්
ආදේශ භාණ්ඩ
නිෂ්පාදකයෝ
වෙළඳපොලට පිවිසීමට
අපේක්ෂිත නව ව්‍යාපාරිකයෝ
ස්වභාවික
ප්‍රජා

**නිපුණතා මට්ටම 1.7 :** ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග, ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන අභ්‍යන්තර පරිසර බලවේග ලැයිස්තුගත කරයි.
- එක් එක් අභ්‍යන්තර පරිසර බලවේගය ආශ්‍රිත ශක්තීන් හා දුර්වලතා සඳහා නිදසුන් දක්වයි.
- ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයේ ශක්තීන් හා දුර්වලතා, ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් කරන ආකාරය තුලනාත්මක ව විග්‍රහ කරයි.
- ශක්තීන් ප්‍රයෝජනයට ගෙන ව්‍යාපාර සාර්ථක කර ගත හැකි ආකාරයත්, දුර්වලතා මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගත් පැහැදිලි කරයි.

## ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග

ව්‍යාපාර අභ්‍යන්තර පරිසර සාධක ලෙස

- අයිතිකරුවන්

ව්‍යාපාරයකට සම්පත් සැපයූ, නැතහොත් අරමුදල් ආයෝජනය කළ ලාභ හෝ පාඩු විඳදරා ගන්නා පාර්ශවය වේ.

- කළමණාකරුවන්

ව්‍යාපාරික සැලසුම් සකස් කිරීම හා තීරණ ගනු ලබන පාර්ශවය වේ.

- සේවකයින්

ඉහළ කළමණාකරුවන් විසින් සකසන සැලසුම් හා ගනු ලබන තීරණ අනුව පහළ මට්ටම්වලට අදාල කාර්යයන්හි නිතර පාර්ශව වේ.

- සංවිධානමය සංස්කෘතිය

ව්‍යාපාරයේ සිටින සියලුම දෙනා අතර බෙදාහදා ගන්නා හා ඊළඟ පරම්පරාව වෙත පවරා දෙනු ලබන විශ්වාස, වටිනාකම්, ආකල්ප, ප්‍රතිමාන, පුරුදු, හැසිරීම් රටා වේ.

- සංවිධාන ව්‍යුහය

සංවිධානයේ අරමුණු පහසුවෙන් ලගා කර ගැනීමට හැකි වන පරිදි සංවිධානයේ කටයුතු සම්පත් හා අධිකාරිය බෙදී යන ආකාරය වේ.

- සම්පත්

භාණ්ඩ හෝ සේවා නිපදවීම සඳහා යෙදවුම් ලෙස භාවිතා කරන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, කාලය, තොරතුරු හා දැනුම යනාදී සියල්ල වේ.

ඒ ඒ පරිසර බලවේගය හා බැඳුනු ශක්තීන් හා දුර්වලතා පහත ආකාරයට ද ඉදිරිපත් කළ හැකිය.

| පරිසර සාධකය | ශක්තීන් | දුර්වලතා |
|---|---|---|
| අයිතිකරුවන් | වැඩි සංඛ්‍යාවක් සිටීම.<br>ඔවුන්ගේ මූල්‍ය ශක්තිය වැඩි වීම.<br>ඔවුන්ගේ දැනුම හා පලපුරුද්ද වැඩි වීම. | සංඛ්‍යාත්මකව කුඩා වීම.<br>මූල්‍ය ශක්තිය හීන වීම.<br>දැනුම හා කුසලතා අඩු වීම. |
| කළමණාකරුවන් | පුහුණුව හා පලපුරුද්දු වැඩි වීම.<br>නිවැරදි තීරණ ගැනීමේ හැකියාව. | පුහුණුව හා පළපුරුද්ද අඩු වීම.<br>තීරණ ගැනීමට පසුබට වීම.<br>වැරදි තීරණ ගැනීම. |
| සේවකයින් | දක්ෂ පලපුරුදු සේවකයින් සිටීම.<br>විවිධ හැකියාවන්ගෙන් යුතු වීම.<br>යහපත් ආකල්ප දැරීම.<br>අභිප්‍රේරණය වූ සේවකයින් සිටීම. | නුපුහුණු සේවකයින් සිටීම.<br>වගකීමෙන් හා වගවීමෙන් තොර සේවකයින් සිටීම.<br>අයහපත් වැඩපුරුදු පැවතීම.<br>සෘණ ආකල්ප දැරීම.<br>අකාර්යක්ෂම සේවකයින් සිටීම. |
| සංවිධානමය සංස්කෘතිය | ධනාත්මක ඇගයීම් හා හර පද්ධතියන් පැවතීම.<br>ආවේණික, දියුණු චර්යා ධර්ම හා පුරුදු පැවතීම. | මනා හර පද්ධති, චර්යා ධර්ම පද්ධති ස්ථාපිත නොවීම.<br>ඉහල අධීක්ෂණයක් නොතිබීම. |
| සංවිධාන ව්‍යුහය | උචිත පරිදි වැඩ බෙදා දීම.<br>උචිත පරිදි සංවිධනය ගොඩනගා තිබීම. | භූමිකා අතර ගැටුම් ඇති වීම.<br>අංශ අතර මනා සම්බන්ධීකරණයක් නොවීම. |
| සම්පත් | ප්‍රමාණාත්මක බව<br>ගුණාත්මක බව | යල් පනින ලද සම්පත් තිබීම.<br>සම්පත් ඌනතාව<br>ප්‍රමාණවත් සම්පත් නොතිබීම. |

පැවරුම 04

පාසලක එදිනෙදා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බලපෑම් කරන බලවේග හඳුනා ගෙන ඒ ඒ බලවේග පාසලේ කටයුතු වලට ධනාත්මකව හා සෘණාත්මකව බලපාන ආකාරය දක්වන්න.

**නිපුණතා මට්ටම 1.8 :** ආසන්න පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 04**

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ආසන්න පරිසර බලවේග ලැයිස්තුගත කරයි.
- ආසන්න පරිසර බලවේග ආශ්‍රිත ව ඇති වන ව්‍යාපාර අවස්ථා ලැයිස්තුගත කරයි.
- ආසන්න පරිසර බලවේග ආශ්‍රිත ව ව්‍යාපාරවලට ඇති වන තර්ජන පෙන්වා දෙයි.
- තෝරාගත් ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේග, එම ව්‍යාපාරයට කරන බලපෑම් සඳහා නිදසුන් දක්වයි.
- ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන ඒවායින් ප්‍රයෝජන ගැනීමටත්, තර්ජනවලට මුහුණ දීමටත් යෝජනා ඉදිරිපත් කරයි.

## ව්‍යාපාර ආසන්න පරිසර බලවේග

ව්‍යාපාර ආසන්න පරිසර බලවේග පහත වේ.

- ගනුදෙනුකරුවෝ ( පාරිභෝගිකයෝ )
  ව්‍යාපාරයේ භාණ්ඩ හා සේවා මිලට ගන්නන් වේ.
  පාරිභෝගිකයින් දැනුවත් බව, පාරිභෝගිකයින්ගේ ආදායම යනාදී කරුණු සමහර ව්‍යාපාර වලට අවස්ථා උදා කරන අතර සමහර ව්‍යාපාර වලට තර්ජන ද ඇති කරයි.
- සැපයුම්කරුවන්
  ව්‍යාපාරයකට අවශ්‍ය සම්පත් සපයන පුද්ලයින් හා ආයතන සැපයුම්කරුවන් වේ.

සැපයුම්කරුවන් කලට වෙලාවට ගුණාත්මක ද්‍රව්‍ය සැපයිම හෝ නො සැපයීම, වට්ටම් ලැබීම හෝ නොලැබිම යනාදී කරුණු ව්‍යාපාර වලට අවස්ථා මෙන්ම තර්ජන ද ඇති කරයි.

- තරඟකරුවෝ

  ව්‍යාපාර ඉදිරිපත් කරන භාන්ඩ හෝ සේවා වලට සමාන නිශ්පාදිත ඉදිරිපත් කරන වෙනත් ව්‍යාපාර තරඟකරුවන් වේ.

  නව තරගකරුවන් වෙළඳපොලට පැමිණිම, වෙළඳපොලේ සිටින තරගකරුවන් ඉවත් වීම, තරගකරුවන් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා සමග විවිධ පහසුකම් සැලසීම ව්‍යාපාර වලට අවස්ථා හි තර්ජන ද උදා කරයි.

- ආදේශක භාණ්ඩ නිපදවන්නෝ

  ව්‍යාපාරය ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාවට විකල්ප භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කරන්නන් ආදේශක භාණ්ඩ නිපදවන්නන් වේ.

- වෙළඳපොලට පිවිසීමට අපේක්ෂා කරන නව ව්‍යාපාරිකයෝ

  වෙළඳපොලට පිවිසීමට අපේක්ෂාවෙන් සිටින්නන්ද පවතින ව්‍යාපාරයකට අවස්ථා හා තර්ජන ඇති කරයි.

**නිපුණතා මට්ටම 1.9 :** සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 06**

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන සාර්ව පරිසර බලවේග ලැයිස්තුගත කරයි.
- එක් එක් සාර්ව පරිසර බලවේගය පැහැදිලි කරයි.
- එක් එක් සාර්ව පරිසර බලවේගය ව්‍යාපාරවලට ඇති වැදගත්කම පෙන්වා දෙයි.
- සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි අති කරන බලපෑම් සඳහා නිදසුන් දක්වයි.
- සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.
- සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධතාවක් පවතින බව නිදසුන් දකවමින් පැහැදිලි කරයි.

## සාර්ව පරිසර බලවේග

ව්‍යාපාරවලට බලපෑම් කරන සාර්ව පරිසර බලවේග පහතින් දක්වෙන ලෙස ඉදිරිපත් කළ හැකිය.

1. ආර්ථික පරිසරය

ව්‍යාපාරවල පැවැත්ම සඳහා ජනතාවගේ ක්‍රය ශක්තිය බලපාන අතර ව්‍යාපාර කටයුතු සඳහා දැරීමට සිදු වන පිරිවැය ද ආර්ථික සාධක මත රඳා පවතී.

උදා:- මිල උද්ධමනය, පොලී අනුපාතය. දල ජාතික නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ජීවන වියදම, ආදායම බෙදීයාමේ විෂමතාව, ඉතිරිකිරීම්, ආයෝජන

මෙම සාධක ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අතර ඉන් ඇති වන අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජන වලට මුහුණ දීමටත් ව්‍යාපාර කටයුතු කළ යුතුය.

2. <u>දේශපාලන පරිසරය</u>

රාජ්‍ය නියෝජිත ආයතන, පවතින රජයේ දේශපාලන ප්‍රතිපත්ති ව්‍යාපාර වලට බලපෑම් කරයි.

උදා:- රජයේ දේශපාලන දර්ශනය හා ප්‍රතිපත්ති, විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම.

එමගින් ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජන වලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතුය.

3. <u>නෛතික පරිසරය</u>

රජයේ අණපනත් හා පනවන නීතිරීති එම රටේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරයි.

උදා:- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, කම්කරු නීති රීති, ශ්‍රී ලංකා ප්‍රමිති පනත

මෙම නීති රීති හා අණපනත් වලට අනුකූලව ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමටත් එමගින් ඇති වන අවස්ථා හා තර්ජන වලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතුය.

4. තාක්ෂණික පරිසරය

සන්නිවේදන තාක්ෂණයේ ප්‍රවණතා හා කෘෂිකාර්මික, කාර්මික, වෛද්‍ය හා අනෙකුත් ක්ෂේත්‍රවල සිදු වී ඇති තාක්ෂණික වෙනස්කම් මීට අයත් වේ.

උදා:- නව තාක්ෂණික සොයා ගැනීම්

තාක්ෂණය සීඝ්‍රයෙන් වෙනස් වීම

සන්නිවේදන තාක්ෂණයේ වෙනස් වීම්

භාණ්ඩ යල් පැනීම

තාක්ෂණික පරිසරයේ වෙනස්වීම හේතුවෙන් ඇතිවන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජන වලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතුය.

5. ප්‍රජා පරිසරය

ව්‍යාපාර සමග සම්බන්ධවන ප්‍රධානම සාධකය ජනගහනයයි. එනම් වෙළඳපොල සමන්විත වන්නේ පුද්ගලයන්ගෙනි.

උදා:- ජනගහනයේ ප්‍රමාණය — ජනවාර්ගික මිශ්‍රය

ජනගහන වර්ධන අනුපාතය — අධ්‍යාපන මට්ටම්

ස්ත්‍රී/පුරුෂභාවය — පවුලේ සංයුතිය

වයස් ව්‍යුහය — ගෘහ රටාව

ප්‍රජා පරිසරයේ ඇති වන ව්‍යාපාර අවස්ථා වලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ කළ යුතුය.

6. ස්වභාවික පරිසරය

ස්වභාවික සම්පත්වලට සිදුවන හානිදායක තත්ව ගැන අද ගෝලීය වශයෙන් අවධානය යොමු වෙමින් පවතී. ලොවේ බොහෝ රටවල ව්‍යාපාර කටයුතු නිසා වාතය, ජලය සහ පස දූෂණයට ලක්ව ඇත. ස්වභාවික පරිසරයේ ඇතිවන වෙනස්කම් ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරයි.

උදාඃ- ස්වභාවික සම්පත් සොයා ගැනීම

කාලගුණික හා දේශගුණික වෙනස්වීම්

භූමියේ පිහිටීම ස්වාභාවික විපත්

මෙහි ඇති වන ව්‍යාපාරික අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජන වලට මුහුණ දීමටත් ව්‍යාපාරිකයා උත්සාහ ගත යුතුය.

7. සමාජීය හා සංස්කෘතික පරිසරය

පුද්ගලයින් තුල ඇති විශ්වාසය, සමාජ සාරධර්ම යනාදිය මීට අයත් වේ.

උදාඃ- පුද්ගලයින් තුළ පවත්නා විශ්වාස හා වටිනාකම්

සිරිත් විරිත්

සිතුම් පැතුම්

අගමික විශ්වාස

මෙම සාධක ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අතර ඒවාට අනුගත වෙමින් ව්‍යාපාර කරගෙන යාමට සිදු වේ.

8. ගෝලීය පරිසරය

ගෝලීයකරණය හේතුවෙන් රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරුවීමට වාසි අවස්ථාවක් සැලසී තිබේ. එසේම පුද්ගලයින්ගේ සංස්කෘතිය ද වෙනසකට ලක් වී තිබේ. මේ නිසා විවිධ භාණ්ඩ හා සේවා ලෝක වෙළඳපොලට එක් වී ඇත. දැඩි තරගකාරීත්වයක් ද දක්නට ලැබේ.

උදාඃ- වෙළඳ ගිවිසුම් ඇති වීම

වෙළඳ හවුල් ඇති වීම

ලෝක සංවිධාන බිහි වීම

අන්තර්ජාතික වශයෙන් නීති රීති ඇති වීම

ගෝලීය පර්සරය තුලින් ඇති වන ව්‍යාපාර අවස්ථා වලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජන වලට මුහුණ දීමටත් ව්‍යාපාරිකයා උත්සාහ ගත යුතුය.

සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම නිදසුනක් මගින් ැහැදිලි කල හැකි ය.

ආර්ථික පරිසරය යටතේ පොලී අනුපාතය අඩුවීම නිසා ණය ගැනීම් වැඩි වී ව්‍යාපාර අවස්ථා උදා වේ. එසේම පොලී අනුපාතය වැඩි වීමෙන් ණය ගැනීම් සීමා වන අතර ව්‍යාපාර වලට තර්ජන වලට මුහුණ දීමට සිදු වේ.

බොහෝවිට සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි බලපෑම් ඇති කිරීම තුලින් ව්‍යාපාර කෙරෙහි අවස්ථා හෝ තර්ජන මතු කරයි.

උදා:- භාණ්ඩ හා සේවා වල මිල මට්ටම වැඩි වීම නිසා සැපයුම්කරුවන් සපයන භාණ්ඩ හා සේවාවල මිල ද වැඩි වේ.

එක් එක් සාර්ව පරිසර බලවේග අතර ද අන්තර් සම්බන්ධතාවයක් පවතින බව පහත නිදසුන් මගින් පැහැදිලි වේ.

- ❖ මැණික් ඉල්ලම් ස්වාභාවික පරිසරයට අයත් වේ නමුත් එය ව්‍යාපාර කටයුත්තක් බවට පත් කිරීමේ දී නීතියේ අවසරය ලබා ගැනීමට අවශ්‍ය වේ.
- ❖ වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා නවීන තාක්ෂණික උපකරණයක් වන ටෙලර් යන්ත්‍රයක් සවි කිරීමේදී මහ බැංකුාව් අවසරය ලබා ගැටළු අවශ්‍ය වේ.

# පසුගිය විභාග ප්‍රශ්න

## 2019 අගෝස්තු I

01. ව්‍යාපාර විකාශනයේ අවධි 4 පහත දැක්වේ.

A- කාර්මික විප්ලවය B-මුදල් භාවිතය

C- භාණ්ඩ හුවමාරුව D-තොරතුරු ආර්ථිකය

ඉහත සඳහන් අවධි නිවැරදි අනුපිළිවෙලට දක්වා ඇත්තේ

1. A, C, D, B 2. B, A, C, D 3. B, D, A, C 4. C, A, B, D 5. C, B, A, D

02. සමාජීය හා සංස්කෘතික පරිසරයට අයත් මූලිකාංග නිවැරදිව ඇතුලත්ව ඇත්තේ

(1) විශ්වාස, අගනාකම්, තාක්ෂණය හා සම්මත

(2) අගනාකම්, ආයතන, වයස් ව්‍යුහය හා සම්ප්‍රදායන්

(3) සිරිත් විරිත්, අගනාකම්, සංවිධාන ව්‍යුහ හා සම්ප්‍රදායන්

(4) විශ්වාස, අගනාකම්, සිරිත් විරිත් හා රෙගුලාසි

(5) විශ්වාස, අගනාකම්, සිරිත් විරිත් හා සම්ප්‍රදායන්

03. පහත වගුවේ සාර්ව පරිසර මූලිකාංග සහ ඊට අදාල සිද්ධීන් කිහිපයක් වේ.

| මූලිකාංග | සිද්ධීන් |
|---|---|
| (I) ආර්ථික | A - දේශගුණික තත්වයන් වෙනස්වීම |
| (II) ස්වභාවික | B - නව කම්කරු නීති රීති බල පැවැත්වීම |
| (III) තාක්ෂණික | C - නව නිෂ්පාදන ක්‍රමයක් සොයා ගැනීම |
| (IV) නෛතික | D – විදේශ විනිමය අනුපාතය වෙනස් වීම |

ඉහත දී ඇති මූලිකාංග අනුපිළිවෙල අනුව සිද්ධීන් නිවැරදිව ගලපා ඇත්තේ

(1) A, B, C, D (2) B, D, C, A (3) C, A, B, D (4) C, D, B, A (5) D, A, C, B

## 2019 අගෝස්තු II

01.අනූෂා ජංගම දුරකථන සිල්ලරව අලෙවි කරන අතරම නව මාදිලියේ දුරකථන කවර (Phone Cover) නිර්මාණය කරන්නියක් ද වේ. නාර්මාණකරණය පිළිබඳව අය සතුව මනා දැනුමක් හා පලපුරුද්දක් වේ. ඇය තම අලෙවිය සහ ලාභය වර්ධනය කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් එම දුරකථන කවර සඳහා පහල මිලක් නියම කරනු ලබයි. 2019 වර්ෂයේ මැද භාගය තුල ඇගේ කවර විකුණුම් ප්‍රමාණය ඒකක 50000 කට ලගා වූ අතර ඒකක 20000 විකුණා ඇත්තේ මංගත (Online) ක්‍රමය තුලනි. අනූෂා තම ව්‍යාපාරය පුලුල් කර ගැනීමේ උපායමාර්ග හදුනා ගැනීම සඳහා Sowt (ශ.දු.අ.ත.) විශ්ලේෂණයෙහි යෙදෙමින් සිටියි.

(i).(අ). ඉහත සිද්ධි අධ්‍යනයෙහි ඇතුලත් ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම් දෙක විස්තර කරන්න.

(ආ). ඉහත ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු දෙක මොනවාද?

(ii). දුරකථන කවර සඳහා ඉහළ පිරිවැටුපක් ඇති වීම කෙරෙහි බලපා හැකි සාධක හතරක් සඳහන් කරන්න.

(iii).මංගත වෙළඳාම තුලින් අනූෂාට ලබා ගත හැකි වාසි දෙකක් හා අවාසි දෙකක් පැහැදිලි කරන්න.

(iv).(අ). ව්‍යඃපාර සඳහා Swot විශ්ලේෂනය නිසා ඇති වන වාසි 4 දක්වන්න.

(ආ).දුරකථන කවර කර්මාන්තය සඳහා පොදුවේ ඇති අවස්ථා දෙකක් හා තර්ජන 2 ක් ලියන්න.

(v). අනූෂා සතුව ඇති ශක්තීන් 2 ක් සඳහන් කරන්න. ඒවා ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනයට කෙසේ යොදා ගත හැකිදැයි පැහැදිලි කරන්න.

## 2018 අගෝස්තු I

01. මිනිස් අවශ්‍යතා හා වුවමනා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) පුද්ගලයෙකුට අවශ්‍යතා අසීමිත ප්‍රමාණයක් ඇති අතර වුවමනා ඇත්තේ සීමිත ප්‍රමාණයක් වේ.

(2) ව්‍යාපාරිකයකුට අවශ්‍යතා නිර්මාණය කල හැකි අතර වුවමනා නිර්මාණය කළ නොහැකි වීම.

(3) අවශ්‍යතා පොදු වන අතර වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

(4) ආදරය, ආහාර, ආරක්ෂාව, කාර්මික අධ්‍යාපනය අවශ්‍යතාවලට නිදසුන් කිහිපයක් වේ.

(5) වුවමනා තෘප්තිමත් කර ගැනීමටපුද්ගලයකු යම් නිශ්පාදිතයක් තෝරා ගැනීම අවශ්‍යතාව වේ.

02. ඕනෑම සංවිධානයකට පොදු නොවන ලක්ෂණ වන්නේ

(1) සම්පත් භාවිතා කිරීමය.

(2) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමය.

(3) භාණ්ඩ හෝ සේවා සැපයීමටය.

(4) රජයේ ප්‍රතිපත්ති හා නීති රීති වලට අනුගත වීමය.

03. නිෂ්පාදිත වර්ගීකරණයේ ගලායෑම හා එයට අදාල උදාහරණය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක්ද?

(1) ස්පෘෂ්‍ය ⟶ භාණ්ඩ ⟶ කල් නොපවතින - මෝටර් වාහන

(2) ස්පෘෂ්‍ය ⟶ භාණ්ඩ ⟶ පාරිභෝගික සේවා - ප්‍රවාහනය

(3) අස්පෘෂ්‍ය ⟶ සේවා ⟶ සෘජු සේවා - බැංකු

(4) අස්පෘෂය ⟶ භාණ්ඩ ⟶ භාවිතය අනුව - ගෘහ භාණ්ඩ

(5) ස්පෘෂ්‍ය ⟶ භාණ්ඩ ⟶ භාවිතය අනුව – රක්ෂණය

04. ව්‍යාපාර පරිසර බලවේග, සාධක හා ඒවායේ බලපෑම් නිවැරද්ව සඳහන් කර ඇති ප්‍රකාශය කුමක්ද?

(1) ව්‍යාපාරයක පරිගණක ක්‍රියාකරුවන් අභ්‍යන්තතර සාධකයක් වන අතර ඔවුන්ගේ කුසලතා අඩු කම ව්‍යාපාරයට තර්ජනයක් වේ.

(2) තරගකරුවන් වැඩි වීම වයාපාරයට තර්ජනයක් වන අතර එය ආසන්න පරිසර බලවේගයක් වේ.

(3) විදේශ විනිමය අනුපාතය පහත වැටීම අපනයනකරුවන්ට අවස්ථාවක් වන අතර එය ආසන්න පරසර බලවේගයක් වේ.

(4) මූල්‍ය ආයතන සාර්ව පාරිසරික බලවේගයක් වන අතර ඔවුන්ගේ දැඩි තරගකාරිත්වය ව්‍යාපාරයට අවස්ථාවක් වේ.

(5) සංවිධන ව්‍යුහය තුල සන්නිවේදනය නිසි පරිදි සිදු වීම සංවිධානයට ශක්තියක් වන අතර එය ආසන්න බාහිර පරිසදර බලවේගයක් වේ.

## 2018 අගෝස්තු II

01. (1). (අ). අවශ්‍යතා, වුවමනා, නිෂ්පාදිත යන පද නිර්වචනය කර ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ආ). නිෂ්පාදන ක්‍රමය සෘජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරු වීමට ප්‍රධාන හේතු 4 ක් දක්වන්න.

(II). (අ). තම පරපුර කෘෂිකර්මාන්තයේ නියුක්ත වීමට අකමැත්තක් දක්වනු ලැබේ.මෙසේ වීමට බලපාන හේතු 4 ක් දක්වන්න.

(ආ). සාර්ව පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂන 2 ක් ලියන්න.

(III). ගෝලීයකරණය යනු කුමක්දැයි අර්ථකථනය කර, එය දේශිය ව්‍යාපාර කෙරෙහි ඇති කරන ධනාත්මක හා සෘණාතිමක බලපෑම් 2 බැගින් විස්තර කරන්න.

(IV). (අ). "සංවිධාන සංස්කෘතිය" යන්න අර්ථකථනය කරන්න.

(ආ). සංවිධාන සංස්කෘතිය තුල ඇති ශක්තීන් හා දුර්වලතාවයන් එක උදාහරණය බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

## 2017 අගෝස්තු I

01. පහත දැක්වෙන්නේ මිනිස් අවශ්‍යතා හා වුවමනා වල ලක්ෂන කිහිපයකි.

A - අසීමිත වීම B - නිර්මාණය කළ හැකි වීම

C - විවිධ වීම D - පැවැත්ම සදහා අත්‍යවශය වීම

E - සීමිත වීම F - පොදු වීම

ඉහත දෑ අතුරෙන් මිනිස් වුවමනා වලට අදාල ලක්ෂන පමණක් අංංගු කාණ්ඩය තෝරන්න.

(1) A, B, D (2) A, B, C 3) A, C, E (4) B, D, E (5) B, D, F

02. පහත වගුවේ X තීරුව මගින් මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ඇල්මැති පාර්ශවකරුවන් කිහිප දෙනෙක් ද Y තීරුව මගින් ඔවුන් ඒ සඳහා උනන්දු වීමට හේතු කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A – පාර්ශවකරුවන් | 1. සාධ්‍ය වෘත්තිකයින්ගේ අයිතීන් තහවුරු කිරීමට |
| B – මහජනතාව | 2. තොරතුරු රැස් කිරීමට |
| C – රජය | 3. තොරතුරු කළමණාකරණයට |
| D – මාධ්‍ය වෘත්තිකයන්ගේ වෘත්තීය සංගම් | 4. තොරතුරු මගින් දැනුවත් වීමට |
| E – මාධ්‍ය ආයතන පරිපාලකයින් | 5. තෙරතුරු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයට |

ඇල්මැති පාර්ශවකරුවන් හා ඔවුන් උනන්දුවක් දක්වීමට හේතු නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A-1, B-2, C-5, D-3, E-4 (2) A-1, B-3, C-4, D-5, E-2

(3) A-2, B-4, C-5, D-1, E-3 (4) A-3, B-1, C-2, D-4, E-5

(5) A-5, B-2, C-3, D-4, E-1

03. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයකට අදාල පාරිසරික සාධකවල ප්‍රවණතා කිහිපයකි.

A- ආර්ථිකයේ මිල මට්ටම ඉහළ යාම B- සේව්‍ය සේවක ගැටුම් වර්ධනය වීම

C- තරඟකාරීත්වය වැඩි වීම D- සේවක පිරිවැටුම අඩු වීම

E- රඳවාගත් සැපයීම් අඩු වීම F- පාරිභෝගික සමිතිවල බලය වැඩිවීම

G- අමුද්‍රව්‍ය අපතේ යාම අඩු වීම H- වයස්ගත ජනගහනය වැඩි වීම

ඉහත දෑ අතුරෙන අභ්‍යන්තර බාරිසරික සාධකවල ප්‍රවනතා පමණක් ඇතුලත් කාණ්ඩය කුමක්ද?

(1) A, B, C, D (2) A, D, E, G (3) B, C, E, H (4) B, D, E, G (5) C, F, G, H

## 2017 අගෝස්තු II

01. (1). (අ). ව්‍යාපාරයක අරමුණු 4 ක් ලැයිස්තු ගත කරන්න.

(ආ). "නිෂ්පාදිත, භාණ්ඩ හා සේවා වලට පමණක් සීමා නොවේ." නිෂ්පාදිත වශයෙන් සැලකිය හැකි භාණ්ඩ හා සේවා නොවන දෑ 4 ක් නම් කරන්න.

(II). (අ). පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණයට අනුව "ලී බඩු" හා "ශබ්දමාලාව" (Glossary) යන භාණ්ඩ අයත් වන වර්ගීකරණය වෙන වෙනම දක්වන්න.

(ආ). ඉහත (ii) (අ) හි ඇති භාණ්ඩ 2 ඔබ සදහන් කල වර්ගීකරණයන්ට අයත් වන්නේ ඇයි දැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

(III). (අ). පසුගිය වසර කිහිපය තුල සංචාරක කර්මාන්තයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට ලැබුණු දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වීමට හේතු වූ කරුණු 2 ක් සදහන් කරන්න.

(ආ). සමහර ව්‍යාපාර ක්ෂේත්‍රවල රාජ්‍ය හා පෞද්ගලික ආයතන තරගකාරී ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින නමුත් පෞද්ගලික අංශයට වඩා රාජ්‍ය අංශයේ ව්‍යාපාරවලින් තම අවශ්‍යතා සපුරා ගැනීමට ජනතාව පෙළඹීමට බලපාන කරුණු 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(IV). ශ්‍රී ලංකාවේ වයස්ගත ජනතාව වැඩි වීම, අවස්ථාවක් විය හැකි කර්මාන්තයක් හා තර්ජනයක් විය හැකි කර්මාන්තයක් බැගින් නම් කර ඊට හේතු දක්වන්න.

## 2016 අගෝස්තු I

01. පාරිභෝගිකයකු විසින් තම අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම සඳහා භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේදී මූලික වශයෙන් සලකා බලනු ලබන සාධක වන්නේ,

(1) වියදම හා ඇසුරුමයි

(2) ඇසුරුම හා ගුණාත්වයයි.

(3) තෘප්තිය හා වෙළඳ නාමයයි

(4) වියදම හා වෙළඳනාමයයි

(5) වියදම හා තෘප්තියයි

04. පහත වගුවේ X තීරුව මගින් ව්‍යාපාර වර්ගීකරණ පදනම් කිහිපයක් ද, Y තීරුව මගින් එම පදනම් සඳහා නිදසුන් කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A – අයිතිය<br>B – අරමුණ<br>C- පරිමාණය<br>D- කර්මාන්ත මූලය<br>E- නිෂ්පාදනයේ ස්වභාවය | 1. මැණික් ගැරීම<br>2. රාජ්‍ය මැණික් සංස්ථාව<br>3. මැණික් ඔප දැමීම<br>4. මැණික් කර්මාන්තය පිළිබඳ නොමිලේ උපදේශන<br>5. සේවකයින් දෙදෙනෙකුගෙන් සමන්විත මැණික් ව්‍යාපාරය |

එක් එක් ව්‍යාපාර වර්ගීකරණ පදනමට ගැලපෙන නිදසුන නිවැරදිව දක්වා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A-2, B-5, C-3, D-4, E-1

(2) A-2, B-4, C-5, D-1, E-3

(3) A-2, B-3, C-4, D-1, E-5

(4) A-1, B-3, C-2, D-5, E-4

(5) A-4, B-2, C-5, D-1, E-3

05. සමන්ත විසින් බේකරි නිෂ්පාදන මිලදී ගෙන අලෙවි කිරීම සඳහා "සමන්ත හෝටලය" නමින් ව්‍යාපාරයක් පළාත් සභාවේද අනුමැතිය ලබාගෙන, ඇගලුම් කම්හලක් ආසන්නයේ පිහිටි ඔහුගේ නිවසෙහි ආරම්භ කරන ලදී. එයට සේවකයින් දෙදෙනෙකු බඳවාගත් අතර හෝටලයේ කළමණාකාරීත්වය ඔහුගේ පුතුට පවරනු ලැබීය.

ඒ අනුව සමන්තගේ ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයන් ගණන

(1) 3 කි (2) 4 කි (3) 5 කි (4) 6 කි (5) 7 කි

06. පහත වගුවේ දැක්වෙන්නේ සාර්ව පාරිසරික සාධක කිහිපයක් හා එම සාධක සඳහා නිදසුන් කිහිපයකි.

| සාර්ව පාරිසරික සාධක | නිදසුන් |
|---|---|
| A – ප්‍රජා විද්‍යාත්මක | 1. රොබෝ තාක්ෂණය දියුණු වීම. |
| B- තාක්ෂණික | 2. වයස්ගත ජනගහනයේ වර්ධනය |
| C- ආර්ථික | 3. ලෝක වෙළඳපොලේ තෙල් මිල ඉහල යාම |
| D- දේශපාලනික | 4. භාවිතා කළ හැකි පොලිතීන් ඝනත්වය නියම කිරීම |
| E- නීතිමය | 5. පස් අවුරුදු ජාතික සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කිරීම. |

සාර්ව පාරිසරික සාධක හා නිදසුන් නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A-1, B-2, C-3, D-4, E-5

(2) A-4, B-5, C-2, D-3, E-1

(3) A-2, B-1, C-3, D-5, E-4

(4) A-4, B-3, C-5, D-2, E-1

(5) A-2, B-1, C-5, D-3, E-4

## 2016 අගෝස්තු II

01. (i) (අ). ව්‍යාපාරයක මූලික ශ්‍රිත (කාර්ය) 4 ක් සඳහන් කරන්න.

(ආ). ගනුදෙනුකරුවන් හා තරගකරුවයන් වෙන වෙන් වශයෙන් ව්‍යාපාරයකට අවස්ථාවක් හා තර්ජනයක් වන්නේ කෙසේදැයි දැක්වීම සඳහා උදාහරණය බැගින් ලියන්න.

(ii) (අ). සංවිධාන සංස්කෘතිය තුල ඇති ශක්තියක් හා දුර්වලතාවයක් සඳහා උදාහරණය බැගින් දක්වා පැහැදිලි කරන්න.

(iii) පහත දක්වා ඇති සාර්ව පාරිසරික සාධක අතර පවතින අන්තර් සම්බන්ධතාව එක් උදාහරණයක් බැගින් දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ). ස්වභාවික පරිසරය - සමාජීයිය හා සංස්කෘතික පරිසරය

(ආ). දේශපාලන පරිසරය - ආර්ථික පරිසරය

## 2015 අගෝස්තු I

01. පහත සඳහන් කරුණු අතුරෙන් වුවමනා වල ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර කුමක්ද?

(1) අසීමිත වීම, විවිධ වීම හා පොදු වීම.

(2) ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි වීම, පොදු වීම හා සීමිත වීම.

(3) පුද්ගල බද්ධ වීම, සීමිත වීම හා විවිධ වීම.

(4) අසීමිත වීම, විවිධ වීම හා පුද්ගල බද්ධ වීම.

(5) පොදු වීම, ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි වීම හා විවිධ වීම.

02. ආර්ථිකයේ විවිධ අංශවලට අයත් ව්‍යාපාර කටයුතු කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරෙන් සේවා අංශයට අයත් ව්‍යාපාර කටයුතු දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ගෘහ කර්මාන්තය හා ආනයන වෙළඳාම

(2) කුරුඳු ආශ්‍රිත නිමවුම් සැකසීම හා ප්‍රවාහනය

(3) ඉදිකිරීම් හා ගෑස්

(4) ප්‍රවාහනය හා ධීවර කටයුතු

(5) සන්නිවේදනය හා ප්‍රවාහනය

03. පහත සඳහන් යුගල අතුරෙන් නොසෙවූ භාණ්ඩ සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ජීවිත රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණය

(2) මෝටර් රථය හා මෝටර් රථ රක්ෂණය

(3) පුද්ගල හදිසි අනතුරු රක්ෂණය හා නිවාස

(4) ප්‍රවෘත්ති පත්‍රය හා මෝටර් රථය

(5) නිවාස සහ ගිනි රක්ෂණය

04. පහත වගුවේ දැක්වෙන්නේ කේවල ස්වාමි ව්‍යාපාරයක කටයුතු සඳහා බලපාන අභ්‍යන්තර බලවේග සහ ශක්තීන් කිහිපයකි.

| අභ්‍යන්තර බලවේග | ශක්තීන් |
|---|---|
| A- සංවිධාන ව්‍යුහය<br>B- හිමිකරු<br>C- සේවකයින්<br>D- භාවිතා කරන සම්පත් | 1. පළපුරුද්ද<br>2. යාවත්කාලීන බව<br>3, කීර්තිනාමය<br>4. තීරණ ගැනීමේ පහසුව |

ඉහත වගුව සැලකිල්ලට ගනිමින් අභ්‍යන්තර බලවේග හා ශක්තීන් නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A-1, B-2, C-4, D-3
(2) A-4, B-2, C-3, D-1
(3) A-4, B-3, C-1, D-2
(4) A-3, B-4, C-2, D-1
(5) A-2, B-1, C-3, D-4

05. පහත වගුවේ X හා Y තීරු මගින් ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේග 2 ක් ද අවස්ථා හා තර්ජන ලැයිසුතුවක් ද පිළිවෙලින් දැක්වේ.

| X | Y |
|---|---|
| A- ආදේශන භාණ්ඩ නිපදවන්නෝ<br>B- කර්මාන්තයේ තරගකාරිත්වය | 1. කර්මාන්තයේ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහලයාම.<br>2. පාරිභෝගිකයින් භාණ්ඩ සන්නම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.<br>3. බුද්ධිය දේපල හිමිකම පිළිබඳ නීතිය ලිහිල් කිරීම<br>4. වෙළඳපොලින් ඉවත් වීමට සීමා පැවතීම. |

ආසන්න පරිසර බලවේග දෙකට අදාල අවස්ථා හා තර්ජන නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-2,4 B-1,3

(2) A-2,3 B-1,4

(3) A-1,4 B-2,3

(4) A-1,2 B-3,4

(5) A-3,4 B-1,2

## 2015 අගෝස්තු II

01. (i). ව්‍යාපාර ආයතන සමාජ සංවිධාන පද්ධතියේ කොටසකි.

(අ). සෑම සංවිධානයකටම පොදු වූ ලක්ෂණ ඇත. විධිමත් ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ කෙටියන් විස්තර කරන්න.

(ආ). "සමාජයේ පැවැත්මට ව්‍යාපාර අත්‍යවශ්‍ය වේ." ව්‍යාපාර නිර්වචනය කරමින් මෙම අදහස පැහැදිලි කරන්න.

(ii) ව්‍යාපාරයක සාර්ථක හෝ අසාර්ථක බවට එහි අභ්‍යන්තර හා බාහිර පරිසරයක් බලපානු ලැබේ.

(අ). ව්‍යාපාරයකට බලපාන අභ්‍යන්තර පරිසර සාධක 2ක් නම් කර, ඒවා ව්‍යාපාරයේ සාර්ථකත්වය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ආ). ව්‍යාපාරයකට බලපාන සාර්ව පරිසර සාධක 2 ක් නම් කර, ඒවා ව්‍යාපාරයේ අසාර්ථකත්වය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශය තුල සේවා සපයන ආයතන බහුලව දක්නට ලැබේ.

(අ). ව්‍යාපාර උපකාරක සේවා 4 ක් සඳහන් කරන්න.

(ආ). ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සේවා 2 ක් කෙටියෙන් විස්තර කරන්න.

## 2014 අගෝස්තු I

01. පහත සඳහන් දෑ අතුරෙන් ව්‍යාපාරයක ප්‍රධාන අරමුණක් ලෙස සැලකිය නොහැකි කරුණ කුමක්ද?

(1) ලාභ උපරිම කිරීම

(2) වෙළඳපොල කොටස වැඩි කර ගැනීම

(3) රැකියා අවස්ථා උපරිම කිරීම

(4) වෙළඳපොලේ රැඳී සිටීම

(5) විකුණුම් උපරිම කර ගැනීම

02. විවිධ පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට බලපාන හේතුන් කිහිපයක් පහත දැක්වේ.

A- ලාභය

B- ව්‍යාපාරික වර්ධනය

C- වෙළඳපොල කොටස

D- ගත් තීරණවල සාර්ථකත්වය

E- වැටුප

F- රැකියාවේ ස්ථාවරභාවය

G- උසස්වීම

H- තනතුරේ සංවර්ධනය

ඊහත සඳහන් දෑ අතුරෙන් කළමණාකරුවන් පමණක් ව්‍යාපාර කෙරෙහි උනන්දුව දක්වන හේතුන් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

(1) A, B, D,H (2) A,C,D,H (3) A,D,E,H (4) B,D,F,H (5) D,E,F,G

03. පහත දැක්වෙන්නේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරනු ලබන පාරිසරික බලවේග කිහිපයකි.

A- ගනුදෙනුකරුවන්
B- සමාජ සංස්කෘතික සාධක
C- තරගකරුවන්
D- සැපයුම්කරුවන්
E- ආදේශක භාණ්ඩ නිෂ්පාදකයින්
F- තාක්ෂණික සාධක

## 2014 අගෝස්තු II

01. (i). සමාජය තුල ව්‍යාපාරය විසින් වැදගත් භූමිකාවන් කිහිපයක් ඉටු කරනු ලැබේ.

(අ). කාර්මික විප්ලවය හේතු කොටගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න.

(ආ). ව්‍යාපාර විසින් සම්පූර්ණ කරනු ලබන විවිධ පුද්ගල අවශ්‍යතා මොනවාද?

(ii). ශ්‍රී ලංකාවේ පැරණි ආර්ථික ක්‍රියාවලිය තුල කෘෂිකර්මාන්තය මූලික වුවද, වර්තමානයේ කෘෂිකර්මාන්තයට අමතර ව විවිධ වූ අංශ වෙත නැඹුරුවීමක් දක්නට ලැබේ.

(අ). මෙම වත්මන් ප්‍රවණතාව සඳහා බලපාන හේතු 4 ක් ලියන්න.

(ආ)."වාණිජ්‍ය" හා "ව්‍යාපාර" අතර ඇති සනම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) පහත දැක්වෙන සංකල්ප යුගල අතර සමාන අසමානකම් විමසන්න.

(අ). වෙළඳපෙලෙ ස්ථානය (Market Place) හා වෙළඳපොල අවකාශය (Market Space)

(ආ).කල්පවතින භාණ්ඩ හා පහසු භාණ්ඩ

(iv). ක්ෂණික ආහාර ව්‍යාපාරය (Fast Food Business) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන්හි ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වේ.

(අ). ක්ෂණික ආහාර ව්‍යාපාරය සීඝ්‍ර වර්ධනයට බලපාන සාර්ව පාරිසරික සාධක මොනවාද?

(ආ). ක්ෂණික ආහාර ව්‍යාපාරය තුළ තම ගනුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීම හා රඳවා ගැනීම කෙරෙහි හිතකර ලෙස බලපාන අභ්‍යන්තර පාරසරික සාධක කෙටියෙන් පැහැදිලි කරන්න.

(v), (අ). ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇතැම් අංශ වල ව්‍යාප්තියක් සමග සිදුවන ව්‍යාපාර ක්‍රියාකාරකම් මගින් සමාජයට හා ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශව වලට අහිතකර බලපෑම් ඇති වේ. එසේ අහිතකර බලපෑම් ඇති කරමින් ව්‍යාප්ත වන අංශ මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

↓

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."